# උපදෙස් පත්‍රිකාව

**අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන -2024/2025**

**සුදුසුකම්**

- 1 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම 50% හෝ ඊට වැඩි හෝ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම

  6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල, 2023 වසරේදී පැවති අවසාන වාර පරීක්ෂණය අනුව 1 - 20 දක්වා ස්ථානයන් ලබාගත් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම

  **සැ.යු. :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත 2023 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම්කළ නොහැකි ය.**

- රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්/ ශිෂ්‍යාවක් වීම
- ශිෂ්‍ය ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රුපියල් 100,000/= නොඉක්මවීම.

**අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.**

- අයදුම්පත්‍රයේ I කොටස සහ II කොටසේ අංක 01 සිට 05 දක්වා කොටස් ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් සම්පූර්ණ කළ යුතු අතර ලකුණු ලබා දීමද ශිෂ්‍ය ශිෂ්‍යාව විසින් ම සිදු කල යුතු ය. අදාළ ලකුණු විදුහලේ තේරීම් කමිටුව විසින් පරීක්ෂා කර සහතික කල යුතු ය

  **සැ.යු :- 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍යයා/ශිෂ්‍යයාවගේ අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම අනුව පන්තිභාර ගුරුවරයා/ගුරුවරිය විසින් නිවැරදි ලකුණු ලබාදීම සිදු කළ යුතු ය.**

- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුලත් කල යුතු ය
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම්, පවුලේ ලඟම ඥාතියෙකුගේ/ පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් ඔවුන්ගේ එකඟතාවය සහිතව ලබා දීමට කටයුතු කල යුතු ය
- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත තම පාසලේ විදුහල්පති වෙත පමණක් අතින් භාර දිය යුතු ය**

> **විදුහල්පති විසින් තම පාසලට උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන තෝරාගත් බව දැනුම් දුන් පසු එම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමක් මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛාවකින් විවෘත කර, එම ගිණුමේ තොරතුරු සඳහන් පිටුවේ සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි ඡායා පිටපතක් විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඡායා පිටපත් විදුහල්පති විසින් සහතික කළ යුතු ය.**
>
> සැ.යු :- **කෙසේ වුවද විදුහල්පති විසින් ශිෂ්‍යත්වලාභියෙකු ලෙස තෝරාගත් බව දන්වන තෙක් බද්ධ ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නැත.**

- **කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතුය.**

**01. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය - සියලු ශ්‍රේණි සඳහා**

**1. පවුල සම්බන්ධ තොරතුරු**

දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව ස දෙමව්පියන් පිළිබඳ විස්තර

**ලකුණු**

| | | |
|---|---|---|
| 1.1 | **ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට** | 03 |
| 1.2 | **ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට** | 04 |
| 1.3 | **ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමඟ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව්දෙනෙකු හෝ ඊට වැඩි වූ විට** | |
| 1.4 | ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට දෙමව්පියන් දෙදෙනාගේම රැකවරණය අහිමිවීම | 10 |
| 1. | දෙමව්පියන්ගෙන් එක් අයෙකුගේ රැකවරණයේ අහිමිවීම | |
| 1.6 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවකදී<br>**(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න)** | 10 |

(උපරිම ලකුණු 25 )

සැ.යු. :- ඉහත 1.4 හි දෙමව්පියන් දෙදෙනාම රැකවරණය අහිමි නම් උපරිම ලකුණු 10ක් හිමි වන අතර, 1.5 හි දෙමාව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ රැකවරණය අහිමිවීම නම් ලකුණු 05ක් පමණක් හිමි වේ.

සහෝදර සහෝදරියන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවය, පූර්ණ දුබලතාවක්ද නැතහොත් අර්ධ දුබලතාවක්ද යන්න පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

**02. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය**

**2.1. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පමණි.**

**2.1.1.** 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් ළඟා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| ළඟා කර ගත් මට්ටම | ලකුණු |
|---|---|
| **100%** | ලකුණු **50** |
| **75%** | ලකුණු **40** |
| **50%** | ලකුණු **30** |
| | **(උපරිම ලකුණු 50)** |

**2.1.2 විෂය සමගාමී ක්‍රියාකාරකම්**

**පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ වෙස්/ පිහිණුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ ගායනය/ චිත්‍ර/ නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම්**

| ස්ථානය | පාසල් මට්ටම |
|---|---|
| පළමුවන ස්ථානය | ලකුණු 08 |
| දෙවන ස්ථානය | ලකුණු 07 |
| තුන්වන ස්ථානය | ලකුණු 06 |

(උපරිම ලකුණු 08)

සැ.යු. :- **ඉහත 2.1.2 හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේදී සාමූහික ක්‍රියාකාරකම් සඳහා ද ලකුණු ලබා දෙනු ලැබේ.**

**2.2. 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් සඳහා පමණි.**

**2.2.1. ශිෂ්‍යයා ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය**

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 45 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 40 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 35 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 30 |
| | (උපරිම ලකුණු 50) |

**2.2.2. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා, සෞන්දර්ය සහ වෙනත්)**

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම් යනාදිය ද ඇතුළත් ව) ආදිය මඟින් ලබා ඇති ජයග්‍රහණ

| | පාසල් මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | | 06 | 07 | 08 |
| දෙවන ස්ථානය | 04 | | 06 | 07 |
| තුන්වන ස්ථානය | 03 | 04 | | 06 |

(උපරිම ලකුණු 08)

**සැ.යු. :-**

- **එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබා දීමට යටත්ව, ආසන්න පසුගිය වසර 03 ක් සලකා බැලීම සුදුසු ය.**
- **ඉහත 2.2.2හිදී, එක් ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේදී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.**

## 03. <u>ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා</u>

පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 07
ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) - ලකුණු 06
පන්ති නායක - ලකුණු 05

(උපරිම ලකුණු 07)

**සැ.යු. :-** ඉහත 03 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම මට්ටම් පමණි.

## 04. <u>ශිෂ්‍යයා/ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - සියලු ශ්‍රේණි සඳහා</u>

**(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)**

දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - ලකුණු 1
(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.)

(උපරිම ලකුණු 10)

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් විද්‍යුත් ලිපිනයට (Email) පණිවිඩයක් යොමු කිරීම මඟින් හෝ දුරකථන අංක වෙත ඇමතුමක් ලබා දිම මඟින් සිදු කළ හැකි ය.**

**විද්‍යුත් ලිපිනයට (Email) :-** pfschol@presidentsoffice.lk

**011 -2 354 354 - දිගු අංක :- 4830/ 4835/ 4837**

**074 - 085 4527 (WhatsApp මඟින් යොමු වන පණිවුඩ පමණි )**